2021.04.08 අරුණ

පිටුව 6

# මේ වසරේ ආර්ථික වර්ධනය සියයට හතරේ මට්ටමේ

■ නයන තරංග ගමගේ

2021 වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය (දළ දේශීය නිෂ්පාදිතය) 4%ක මට්ටමේ පවත්වනු ඇතැයි අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ නවතම වාර්තා ප්‍රකාශ කරයි. එහෙත් මූල්‍ය අරමුදල 2020 ඔක්තෝබර් මාසයේදී සිදුකළ පුරෝකථනයන්ට අනුව 2021 වසරේදී මෙරට ආර්ථික වර්ධන වේගය 5.3%ක් වනු ඇතැයි ප්‍රකාශ කර තිබිණි.

කොරෝනා වසංගතය සහ මූල්‍ය අස්ථාවරත්වය හේතුවෙන් 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 3.6%කින් හැකිළී ඇති බව නිල සංඛ්‍යාලේඛන වාර්තා කර තිබේ. මේ අතර 2020දී 3.5%ක ආර්ථික අවගමනයක් වාර්තා කළ අමරිකා එක්සත් ජනපදය 2021දී 6.4%ක වර්ධනයක් අත්පත් කරගනු ඇතැයි මූල්‍ය අරමුදල පවසයි. එසේම යුරෝපය 2021දී 4.5%කින් සිය ආර්ථිකය වර්ධනය කරගනු ඇතැයි එම වාර්තාවන් අනාවරණය කරයි.